GMOA
ESTABLISHED IN 1926
TU No. 291

Tel : 2580886 / 0714 999555
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.lk

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

**27.08.2011**

## පුවත්පත් නිවේදනය

හදිසි අනතුරකින් පසු බලපිටිය මූලික රෝහලට ඇතුළත් කරනු ලැබූ රෝගියෙකුගේ මරණය සම්බන්ධයෙන් වෛද්‍යවරුන්ට චෝදනා නගමින් ඊයේ දිනයේදී පැවති උද්ඝෝෂණය නිසා එම ප්‍රදේශයෙහි දැඩි ව්‍යාකූල තත්ත්වයක් ඇතිවිය.

ඉතාම අඩු සේවා තත්ත්වයන් යටතේදී උපරිම මට්ටමේ සේවාවක් සළසන්නා වූ වෛද්‍ය කාර්යය මණ්ඩලයට එරෙහිව මෙවැනි පදනම් විරහිත චෝදනා නැගීම කණගාටුදායක තත්ත්වයකි. එමෙන්ම රෝහලේ ඇති අවම පහසුකම් සම්බන්ධව හා අසතුටුදායක සේවක සුභසාධනය සම්බන්ධව විද්වත් කතිකාවතක් ඇති කරනු වෙනුවට පටු දේශපාලන අරමුණු උදෙසා මෙලෙස ක්‍රියා කිරීම අනුමත කළ නොහැකි තත්ත්වයකි. මේ නිසා රෝහලේ ශල්‍ය වෛද්‍ය ඒකකය වසා දැමීමට සිදුවුවහොත් එහි වගකීම ඉහත විරෝධතාවය මෙහෙයවූ කඩාකප්පල්කාරී පිරිස විසින් දැරිය යුතුය.

මේ සමබන්ධව විරෝධතාව දැක්වීම උදෙසා අගෝස්තු 29 වන දින එක්දින සංකේත වැඩ වර්ජනයක නිරතවීමට අප සංගමයේ බලපිටිය මූලික රෝහල් ශාඛාව තීරණය කර ඇත.

වෛද්‍ය චන්දික එපිටකඩුව,
ලේකම්.

| | | |
|---|---|---|
| වැඩිදුර විස්තර | වෛද්‍ය උපුල් ගුණසේකර | - 0716841272 |
| | වෛද්‍ය සංකල්ප මාරසිංහ | - 0714486770 |